**සූරියවැව ප්‍රාදේශීය සභාව - 2020**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1. තත්ත්වාගණනය කළ මතය**

සූරියවැව ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට සූරියවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු. 2,429,533 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | උසාවි දඩ ලේඛනය 2018 වර්ෂයේ සිට යාවත්කාලීන කිරීමේදී සිදු වූ දෝෂයක් බවත්, ඉදිරියේදී ලේඛනය නිවැරදිව පවත්වා ගෙන යාමට කටයුතු කරමි. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | වර්ෂයක් හෝ ඊට අඩු කාලයක් සඳහා ගෙවිය යුතු වගකීම් ජංගම වගකීම් යටතේ දැක්විය යුතු නමුත් ඉදිරි වර්ෂය වෙනුවෙන් දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.2,200,310 ක ණය වාරික එකතු වටිනාකම ජංගම වගකීම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | ඉදිරියේදී ගිණුම් නිවැරදිව සකස් කිරීමට කටයුතු කරමි. | වගකීම් නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | තොග ලේඛනයේ සටහන් කළ යුතු එකතු වටිනාකම රු. 1,550,079 ක් වූ තොග ඒකක 1335 ක් යන්ත්‍රසූත්‍ර හා උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | තොග අයිතමයන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | විස්තරාත්මක තොරතුරු නොමැතිව සමාලෝචිත වර්ෂයේදී ලද මුද්දර ගාස්තු රු. 882,000 ක් වගකීමක් ලෙස හඳුනා නොගෙන ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී ගිණුම් නිවැරදිව සකස් කිරීමට කටයුතු කරමි. | වගකීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2019 වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු සහ සමාලෝචිත වර්ෂය සඳහා වෙන් කරන ලද මුද්දර ගාස්තු රු. 1,273,204 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම මඟින් අඩුවෙන් සටහන් වීම නිවැරදි කරමි. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී රු. 460,325 ක් වූ ප්‍රාග්ධන වත්කම් ඉදිකිරීමේ වියදම් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | ප්‍රාග්ධන වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 අවිනිශ්චිත ගිණුම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ සිට ඉදිරියට එමින් පවතින රු. 589,343 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය ගැළපීම් නොකර සමුච්චිත අරමුදලට ගලපා තිබුණි. | ඉදිරියේදී අවිනිශ්චිත ගිණුමේ ශේෂය හඳුනා ගැනීමට කටයුතු කරමි. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 261,241,986 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | විස්තරාත්කමක උපලේඛන, ශේෂ සනාථන සහතික සහ කාල විශ්ලේෂණය ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 | කොම්පෝස්ට් ව්‍යාපෘතියේ දැල් වැට සකස් කිරීමට මිලදී ගත් බට වලින් අස්ථාන ගතවූ බට සම්බන්ධයෙන් සිදු කළ අවසන් පරීක්ෂණය අනුව සභාවේ නිලධාරීන්ගෙන් හා කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගත යුතු රු. 76,200 ක අලාභය අයකර ගෙන නොතිබුණි. | වගකිව යුතු පාර්ශවයන් වෙත අලාභය ගෙවන මෙන් ලිපි යොමුකර ඇති බවත්, නොගෙව්වහොත් නීතිමය පියවර ගැනීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 21,130,642 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,767,505 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් 2016 වර්ෂයේ සිට ගණුදෙනු සඳහා භාවිතා නොකරන ලද ඉතුරුම් ගිණුමක සමාලෝචිත වර්ෂයේ අවසානයට රු. 308,050 ක ශේෂයක් පැවතුණි. | මෙම ශේෂය ස්ථාවර තැන්පතු ගිණුමක ආයෝජනය කිරීමට කටයුතු කරන බව. | අක්‍රිය ගිණුම් වසා දැමීමට හෝ ආයෝජනයක යෙදවීමට කටයුතු කළ යුතුය. |

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **කුලී** | | |
| i. | ලැබිය යුතු කඩ කුලී රු. 839,200 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු. 228,550 ක් කපා හැරීම සඳහා අනුමැතියට ආණ්ඩුකාරතුමාට යොමු කළ බව සහ ඉතිරි හිඟ මුදල් ඉදිරියේදී අයකර ගනිමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| ii. | සූරියවැව සතිපොළ හා තොග වෙළඳ පොළට අදාළව ලැබිය යුතු රු. 55,910 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි හිඟයන් කපා හැරීම සඳහා ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කළෙමි. | - එම - |
| iii. | පළාත් පාලන කොමසාරිස්ගේ (දකුණු) 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/ පපාකො / 2010 / 01 දරන චක්‍රලේඛනයේ 04 වන ඡේදය පරිදි සභාව සතු කඩ කාමර 11 කින් රු.492,672 ක එක්වන් මුදල් අයකර ගෙන නොතිබූ අතර හිඟයෙන් රු. 292,592 ක් 2011 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂයක් විය. | හිඟ එක්වන් මුදලින් රු. 270,992 ක් කපා හැරීම සඳහා අනුමැතියට ආණ්ඩුකාරතුමාට යොමුකළ බවත්, ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**(ආ) බලපත්‍ර ගාස්තු**

| | | | |
|---|---|---|---|
| i. | ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු රු. 24,500 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි | ඉතිරි හිඟ බලපත්‍ර ගාස්තු ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| ii. | ලැබිය යුතු දැන්වීම් පුවරු ගාස්තු රු. 290,075 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි | ඉතිරි හිඟ ගාස්තු අයකර ගැනීමට කටයුතු කරමි. | - එම - |

**(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු. 3,528,532 ක් විය. | පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙන් සහතික නොකළ 2013 හා 2015 වර්ෂයන්ට අදාළ හිඟයක් උසාවි දඩ ලේඛනයේ ඇතුළත්ව තිබීමෙන් හිඟය වැඩි වූ බව සහ ඉදිරියේදී එම ශේෂයන් ලේඛනවලින් ඉවත් කිරීමට කටයුතු කරමි. | - එම - |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කරුණු විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ දෛනික කටයුතු පහසු කර ගැනීම සඳහා පෞද්ගලික ආයතනයකින් 2017 වර්ෂයේදී රු. 240,000 ක් ගෙවා මිලදී ගත් ගබඩා, පෞද්ගලික ලිපිගොනු, වාහන හා ලේඛනාගාර කටයුතු පරිගණක මෘදුකාංග පද්ධති 04 ක් අතුරින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිසි පරිදි ක්‍රියාත්මක වී තිබුණේ ලේඛනාගාර පද්ධතිය පමණක් වූයෙන් අනෙකුත් පද්ධති සඳහා දරන ලද රු.180,000 ක වියදම අනාර්ථික වියදමක් විය. | ගබඩා පද්ධතිය දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින බව සහ අනෙකුත් පද්ධතිවල අඩුපාඩු සකස් කර ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. | ආයතනයට ගැළපෙන හා ඵලදායි මෘදුකාංග පද්ධතියක් මිලදී ගත යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නීතිමය ක්‍රියාමාර්ග ගතයුතු කාලය ඉක්මවූ ව්‍යාපාර ඒකක 65 ක් සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ නිර්දේශ 2020 නොවැම්බර් 30 දින වන විටත් සභාව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් නිර්දේශ ලබා දෙන මෙන් ඉල්ලීම් කළද නිර්දේශ ලබා ගැනීම ප්‍රමාද වූ බවත්, 2021 වර්ෂයේ බලපත්‍ර ගාස්තු අයකිරීමේදී අදාළ හිඟය අයකර ගැනීමට කටයුතු කරමි. | මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ නිර්දේශ කඩිනමින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 1993 ජුනි 24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පලකර ඇති 1980 අංක 49 දරන ජාතික පාරිසරික පනතේ නියමයන් පරිදි ලබාගත යුතු පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තා නොමැති ව්‍යාපාර 13 ක් සඳහා වෙළඳ බලපත්‍ර ලබාදී තිබුණි. තවද සමාලෝචිත වර්ෂය සඳහා පාරිසරික බලපෑම තක්සේරු කිරීමේ වාර්තා ලබා නොගත් ව්‍යාපාර 19 ක් සඳහා එම වාර්තා ලබා දීමට හෝ වාර්තා ලබා ගැනීමට කර්මාන්ත හිමියන් උනන්දු කරවීමට සභාව කටයුතු කර නොතිබුණු අතර එමඟින් සභා අරමුදලට වූ පාඩුව රු. 83,752 ක් විය. | ව්‍යාපාර 19 අතුරින් මේ වන විට ව්‍යාපාර 05 ක් සඳහා පරිසර බලපත්‍ර ලබා දී ඇති බවත්, ව්‍යාපාර 03 ක අසම්පූර්ණ අයදුම්පත්‍ර සම්පූර්ණ කර කමිටුවට ඉදිරිපත් කිරීමට කටයුතු කළ බවත්, ඉතිරි ව්‍යාපාර 11 න් 10 කට බලපත්‍ර ලබා ගන්නා මෙන් ලිපි යොමු කළ බවත්, එක් ව්‍යාපාරයකට බලපත්‍රයක් ලබාදිය නොහැකි බව. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා දීමට කටයුතු කිරීම සහ ව්‍යාපාරිකයින් බලපත්‍ර ලබා ගැනීමට උනන්දු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සභාව විසින් දෛනිකව රැස් කරනු ලබන කසළ වෙන් කිරීමකින් තොරව අවිධිමත්ව බැහැර කරන බවත්, වසර කිහිපයකට පෙර ආරම්භ කිරීමට සැලසුම් සකස් කර තිබූ කොම්පෝස්ට් නිපදවීමේ කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන සමාලෝචිත වර්ෂයේදීත් ආරම්භ කර නොතිබුණි. | කසළ දිරන, නොදිරන ලෙස වෙන් කළද කසළ අංගනය විවෘත භූමියක් වන බැවින් බාහිර පුද්ගලයින් භූමියට කසළ බැහැර කරන බවත්, ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලද පසු ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන ආරම්භ කරමි. | කසළ විධිමත්ව බැහැර කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කඩිනමින් ආරම්භ කළ යුතුය. |
| (ආ) උක්ත වැඩසටහනට අදාළව 2017 අගෝස්තු 03 දිනැති අංක SU/HB/07/03/2015 දරණ මධ්‍යම පරිසර අධිකාරි ලිපියේ සඳහන් ඉටු කළ යුතු පාරිසරික නිර්දේශ ඇතුළත් කොන්දේසි 06 සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් ඉටු කර නොතිබුණි. | කොම්පෝස්ට් අංගනය විවෘත භූමියක් වන බැවින් වල් අලි තර්ජනයට ලක්වන බවත්, භූමිය වටා විදුලි වැට සකස් කිරීමේදී විරෝධතා පැනනැගුණු බව සහ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අවශ්‍ය ලිපි ලේඛන සකස් කර ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට යොමු කළෙමි. | ලිපියේ සඳහන් කොන්දේසි ඉටුකළ යුතුය. |